

# ජනාධිපතිනිය මහින්ද රනිල් හා ජනතාව




ධනුද්ධර

කවුරු කවුරුත් පුල පුලා බලා සිටි දිනය ප්‍රකාශයට පත් වී තිබේ. ජනාධිපතිවරණය නොවැම්බර් මස 17 දින පවත්වන බව මැතිවරණ කොමසාරිස්වරයා ප්‍රකාශ කොට ඇත. මැතිවරණ දිනය ප්‍රකාශ කිරීම මෙතරම් ප්‍රමාද වුව ද ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනාගේ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාර ඇරැඹී බොහෝ කල් ය. ඒ අනුව දැනටමත් නොවැම්බර් 17 දා පැවැත්වෙන ජනාධිපතිවරණයේ ජයග්‍රාහකයා කවුදැයි කිය හැකි තත්වයක් ඇති වී තිබේ.

දෙමළ ජාතික සන්ධානය, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය හා ලංකා කම්කරු කොංග්‍රසය හැරුණු විට අනෙකුත් සියලු ම පක්ෂ මේ වන විට අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාට සහාය පල කිරීමට ඉදිරියට පැමිණ සිටිති. දෙමළ ජාතික සන්ධානනය, මුස්ලිම් කොංග්‍රසය හා ලංකා කම්කරු කොංග්‍රසය තවමත් සිය සහාය දෙන්නේ කවරෙකුට දැයි ප්‍රසිද්ධියේ ප්‍රකාශ කොට නැත. කෙසේ වෙතත්, පසුගිය දිනෙක මුස්ලිම් කොංග්‍රස් නායක රාවුෆ් හකීම් මහතා පවසා ඇත්තේ එල්ටීටීඊ යට ගැති නොවන අපේක්ෂකයකුට තම පක්ෂයේ සහාය ලබා දෙන බව ය. එය ද මහින්ද රාජපක්ෂ මහතා දෙසට හැරුණු කොළ එළියකි. දෙමළ සන්ධානය රනිල් වික්‍රමසිංහට මිස මහින්ද රාජපක්ෂට සහාය දෙන්නේ නැත. ලංකා කම්කරු කොංග්‍රසයේ සහාය ද මහින්දට ලැබෙනු ඇතැයි විශ්වාසය පලව තිබේ.

මේ අනුව, සියලු සාධක ගොඩ නැඟෙන්නේ මහින්ද රාජපක්ෂගේ වාසියට ය. ඔහුට අපේක්ෂකත්වය නොදෙනු ඇතැයි ද ජනාධිපති අපේක්ෂකයා තෝරා ගැනීමේ දී ශ්‍රීලනිපය තුළ ගැටුම් ඇතිවනු ඇතැයි ද යන සැකය තිබුණ ද මහින්දට අපේක්ෂකත්වය හිමිවුණේ කිසිදු ගැටුමකින්, තොරව ය. ජනාධිපතිවරණය 2005 ට ඉල්ලා රනිල් පා ගමන් ගිය ද මැතිවරණය 2005 ට ලැබීමේ වාසය හිමිවුණේ මහින්දට ය. හෙළ උරුමය වැනි අන්ත ජාතිකවාදී පක්ෂයක් සමඟ එක්වීම තුළ කිසියම් අවාසි සහගත තත්වයක් ඇතත් ජවිපෙ ජවිපෙ ඇතුළු පක්ෂ රැසක සහාය මහින්දට ය. මේ සියලු වාසි සහගත තත්වයන් තුළ ජනාධිපතිවරණ දිනය නියම වී ඇත්තේ ද ඔහුට වාසි සහගත ලෙස ය. මැතිවරණය පැවැත්වෙන්නේ ඔහුගේ 60 වැනි උපන් දිනයට පෙර දිනයේ ය.

මේ අන්දමට මහින්ද රාජපක්ෂට වාසි සහගත තත්වයක් නිර්මාණ වී තිබීම නිසා 'මහින්ද දිනනවා' යැයි මතයක් ද පොදු ජනතාව අතර පැතිර තිබේ. එසේ වුව ද මහින්දගේ ජය පිළිබඳ අවිනිශ්චිත භාවයක් ද නැත්තේ නොවේ. එම අවිනිශ්චිත භාවය ඇති වී ඇත්තේ ඔහුගේ ප්‍රතිවාදී අපේක්ෂකයාට ඇති වාසි සහගත තත්වයක් නිසා නොවේ. ජනාධිපතිනිය දක්වන ප්‍රතිචාර අනුව ය. ජනාධිපතිනිය මේ වන විට සිටින්නේ මහින්ද රාජපක්ෂ දිනවන පැත්තට බරව නොව පරදවන පැත්තට බරව ය. ඊට හේතු ලෙස ඇය දක්වා සිටින්නේ අගමැතිවරයා ජවිපෙ හා විශේෂයෙන් ම හෙළ උරුමය සමඟ ඇතිකරගත් එකඟතා හා එහි දී 'ඒකීය රාජ්‍ය' පිළිගැනීම ය. මේ පිළිබඳ අගමැතිවරයාට දොස් පවරන ජනාධිපතිනිය ඒ බව ලිඛිතව ම ඔහුට දැනුම් දී තිබේ. අක්කා අනුව ම යමින් අගමැති ධුරයට පත්වන්නට නියමිත අනුර බණ්ඩාරනායක අමාත්‍යවරයා ද මහින්දගේ කටයුතු විවේචනය කරන්නට පටන් ගෙන තිබේ.

මේ තත්වය අගමැතිවරයාගෙ' මැතිවරණ සටන මෙහෙයවන පිරිස අතර කුකුසක් ඇති කොට ඇති අතර මෙම තත්වයෙන් පිනා ගොස් සිටින්නේ එක්සත් ජාතික පාක්ෂිකයන් ය. ඔවුන්ගේ අදහස වී ඇත්තේ ජනාධිපතිනිය, අවසන් මොහොතේ මහින්දගේ කකුලෙන් අදින අතර එනිසා තම අපේක්ෂකයාට ජය ගැනීම 'කජු කන්නාක්' වැනි වැඩක් බව ය.

ජනාධිපතිනිය මහින්ද රාජපක්ෂට අපේක්ෂකත්වය ලබාදීමට එකඟවූයේ වෙන කළ හැකි යමක් නොවූ නිසා ය. කෙසේ වෙතත් එය ලබා දීමෙන් ඇයට අත් වූ ගෞරවය ඇයගේ දැන් හැසිරීම විසින් නැති කොට තිබේ.

1994 දී පක්ෂ නායිකාව වූ තම මෑණියන් යටපත් කරමින් අගමැතිකම, ජනාධිපතිකම ලබා ගැනීමේ දී තමන්ට ද මෙවැනිම තත්වයකට මුහුණ දෙන්නට සිදු වූ බව ඇයට අද අමතකය. ඇත්ත වශයෙන් ම 1994 දී පොදු පෙරමුණටත්, ඇයටත් ජය හිමිවූයේ එදා චන්ද්‍රිකා ප්‍රමුඛ කණ්ඩායම ගනු ලැබූ ඇතැම් හිතුවක්කාරී තීරණ නිසා ය. එසේ නම් ඉදිරියේ දීත් පක්ෂයේ පැවැත්මටත්, සන්ධාන ආණ්ඩුවේ පැවැත්මටත් ගත යුතු ව ඇති ඇතැම් තීන්දු තීරණ තමන්ගේ හදවතට රිදුම් ගෙන දුන්න ද ඒවා ගත යුතු යැයි චන්ද්‍රිකා නොදන්නවා යැයි කිව නොහැක.

මේ ඇති වී තිබෙන තත්වයට අගමැතිවරයා ද වගකිව යුතු ව තිබිණ. ඔහු අනෙකුත් පක්ෂ සමඟ එකඟතා ඇතිකර ගැනීමේ දී මීට වඩා කල්පනාකාරී වූයේ නම් ජනාධිපතිනියගෙන් එල්ල වී ඇති විරෝධතා අව ම වීමට ඉඩ තිබිණ. එහෙත් එලෙස හැසිරීමට තරම් අගමැතිවරයාගේ දේශපාලන විඥානය පුළුල් නොමැත.

එක්සත් ජාතික පාක්ෂිකයන් තම අපේක්ෂකයාව ජයගනු ඇතැයි අපේක්ෂා කරන්නේ ඔහුගේ ශක්තිය හෝ ඔහුට ඇති ජනතා ප්‍රසාදයක් නිසා නොව ජනාධිපතිනියගේ ස්ථාවරය නිසා ය. ඔවුන් මුලදී අපේක්ෂා කළේ ජනාධිපතිනිය ජනාධිපතිවරණයට පෙර පාර්ලිමේන්තුව විසුරුවනු ඇතැයි කියා ය. එහෙත් දැන් ජනාධිපතිවරණ දිනය ප්‍රකාශ කොට ඇති තත්වය තුළ පාර්ලිමේන්තුව විසුරුවා හැරිය ද ඉන් ඵලක් නැත. දැන් ජනාධිපතිනියට කිරීමට ඉතිරිව ඇත්තේ මහින්ද රාජපක්ෂ වෙනුවට ශ්‍රීලනිපයෙන් වෙනත් අපේක්ෂකයකු නම් කිරීමය. එහෙත් ජනාධිපතිනිය එතරම් අනුවන තීරණයක් ගනු ඇතැයි සිතිය නොහැක. කෙසේ වුව ද මහින්ද රාජපක්ෂට සිය මැතිවරණ ව්‍යාපාරය ඉදිරියට ගෙන යෑමට සිදුවන්නේ ජනාධිපතිනියගේ ආශිර්වාදය නොමැතිව බව පැහැදිලි ය. ජනාධිපතිනිය මැතිවරණ ව්‍යාපාරයට එක් නොවීම එක් අතකින් වාසිදායක වන අතර ම එහි අවාසියක් ද ඇත. වාසිය වන්නේ මහින්ද යනු අලුත් නායකයෙක් ය යන මතය සේම තව දුරටත් ඔහු ජනාධිපතිනියට යටත් අයකු නොවන බව පෙන්වීමට හැකි වීම ය. අවාසිය නම් සාම්ප්‍රදායක ශ්‍රීලනිප ඡන්ද කෙරෙහි ජනාධිපතිනිය නොසිටීම බලපෑමක් කළ හැකි බැවිනි.

දැනටමත් ජනාධිපතිනියගේ නොපහන් සිත නිසා මහින්ද රාජපක්ෂගේ මැතිවරණ

20 වන පිටට

